## සිංහල පරිවර්තනය

**උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 22/2025**

මගේ අංකය: NP/07/10/04/86
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
යාපනය
2025.07.18

ප්‍රධාන ලේකම්
ආණ්ඩුකාර ලේකම්
අමාත්‍යාංශ ලේකම්වරුන්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
උතුරු පළාත

## උතුරු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සීමිත තරඟ විභාගය - 2025

**1.** උතුරු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සීමිත තරඟ විභාගයේ ලිඛිත පරීක්ෂණය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය ත්‍රිත්වයෙන්ම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **2025 ඔක්තෝබර් මස** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2025.08.11 දින වේ.**

**2.** මෙම විභාගය පහත සඳහන් නගරවල පැවැත්වේ. විභාග මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට අපේක්ෂිත නගර හා ඊට අදාළ නගර අංක පහතින් දැක්වේ.

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| බදුල්ල | 03 |
| මාතර | 04 |
| යාපනය | 05 |

ඉහත සඳහන් යම්කිසි නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවුණහොත් එම මධ්‍යස්ථානය අවලංගු කරන අතර එම අයදුම්කරුවන් යාබද නගරයක පිහිටි මධ්‍යස්ථානයක් වෙත යොමු කෙරෙනු ඇත. ඉල්ලුම් කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කරනු ඇත.

**3.** විභාග කොමසාරිස් ජනරාල්ගේ උපදෙස්වලට යටත්ව මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට උතුරු පළාතේ පළාත් රාජ්‍ය කොමිෂන් සභාවට බලය ඇත.

**4.** **සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන පුරප්පාඩු ප්‍රමාණය, අධිශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා කුසලතා ධාරාව හෝ සීමිත ධාරාව යටතේ මෙම වර්ෂයේ අයදුම්පත් කැඳවා පැවැත්වෙන තරඟ විභාග අතරින් පළමුව පවත්වන තරඟ විභාගයේ අවසන් දිනට ගණනය කරනු ලැබේ.** එම පුරප්පාඩු ප්‍රමාණය අදාළ විභාගයේ අවසන් දිනට පසු නැවත ප්‍රසිද්ධ දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරන අතර එසේ ප්‍රසිද්ධ කළ පසු පුරප්පාඩු ප්‍රමාණය නැවත සංශෝධනය නොකරනු ඇත. එම දිනට අදාළ පුරප්පාඩු වලින් 50% ක් සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සම්පූර්ණ කරනු ලැබේ. සීමිත තරඟ විභාගයෙන් සමත්වීම සඳහා සෑම විෂයකටම අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගත යුතුය. ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන්, උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු පත්වීම් පිරිනමනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන සහතිකපත්‍ර සහ ලිපිලේඛන පරීක්ෂා කිරීම සඳහා පමණක් පවත්වනු ලබන අතර, ඒ සඳහා ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ.

**5.** 2025.03.25 දිනැති හා අංක 10/2025 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 7-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 71,240/ - 11x1,360 - 18x1,850 - රු. 119,500/- ක් වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**6.** **සපුරාලිය යුතු සුදුසුකම්: -**

**අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට (2025.08.11)** රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානවලට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති ඒකාබද්ධ සේවයට අයත්,

(අ). පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම;

හෝ

(ආ). අවම වශයෙන් සේවයේ වසර අටකට (08) නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම;

හෝ

(ඇ). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය සමත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියකු වීම;

සහ

(ඈ). නියමිත දිනට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කිරීම.

සටහන (I)

පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ දැනට රැඳී සිටින ශ්‍රේණිය අනුව ඉහත (අ), (ආ), (ඇ) මගින් දක්වා ඇති සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කරන ලද, දැනට රැඳී සිටින ශ්‍රේණියට අදාළව සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව සම්පූර්ණ කළ යුතු වන අවම වාර ගණන තුළ අයදුම්පත් කැඳවීමේ අවසාන දින වනවිට සමත් වූ නමුත් පරිපාලන හේතුන් මත අදාළ කාර්යක්ෂමතා කඩඉම් සහනය ප්‍රමාදවීම නිසා සේවයේ ස්ථිරවීම හෝ උසස්වීම හෝ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අභිමිවීම නිසා පමණක් සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කිරීමට නොහැකි වූ නිලධාරින්ට ද මෙම විභාගයට අයදුම් කළ හැකි වේ.

සටහන (II)

කෙසේ වෙතත් එම නිලධාරින්ට අයදුම් කිරීමට සහ විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලබා දීම උසස්වීම ලබාගැනීම සඳහා සුදුසුකමක් නොවන අතර අධිශ්‍රේණියට උසස්වීම් ලිපිය නිකුත් කරනු ලබන්නේ නිසි පරිදි පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සතුටුදායක සේවා කාලය සපුරන ලද බවට සෑහීමට පත්ව අදාළ ස්ථිර කිරීම/උසස් කිරීම උපයා ගත් පසුව වේ.

**7. අයදුම්කිරීමේ පිළිවෙල:-**

**(අ)** අයදුම්පත මෙම චක්‍රලේඛයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය සෙ.මී.25.5 x සෙ.මී.21 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අපේක්ෂකයා විසින්ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ ශීර්ෂ අංක **01** සිට **05** තෙක් පළමු පිටුවට ද, **06** සිට **09** තෙක් දෙවන පිටුවට ද ඉතිරිය තුන්වන පිටුවට ද ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ නිවැරදිව සම්පූර්ණ කර නොමැත අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය පිළියෙළ කිරීමේ දී එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල සහ දෙමළ අයදුම්පත්‍රවල අදාළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතුය. අයදුම්පත සකස් කිරීම හා සම්පූර්ණ කිරීම කළ යුත්තේ තමන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීමට අපේක්ෂා කරනු ලබන භාෂා මාධ්‍යයෙන්මය. (සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් තමා ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

**(ආ) ආයතන ප්‍රධානියාගේ සහතික කිරීම**

අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර එහි ඡායා පිටපතක් සමග තම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ලබාගැනීමෙන් පසු අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කළ යුතුය. අයදුම්පත්‍රයේ මුල් පිටපත තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, 393/48, කෝවිල පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට **2025.08.11** දිනට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් යොමු කරන අයදුම්පත්‍රයට අමතරව පෞද්ගලිකව යොමු කරනු ලබන අයදුම්පත්‍රයේ වෙනත් කිසිදු පිටපතක් පිළිගනු නොලැබේ. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේක කරනු ලැබේ. සෑම අයදුම්පත්‍රයක් ම සෑම ආකාරයකින්ම

සම්පූර්ණ කර ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතු අතර, අයදුම්පත්‍රයේ 14 වන වගන්තියේ දක්වා ඇති ප්‍රතිඥාවෙහි ද තම අත්සන යෙදිය යුතුය. අයදුම්පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට හෝ එම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුට හෝ පෞද්ගලික ලිපිනයට යොමු නොකළ යුතුය. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"උතුරු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සීමිත තරඟ විභාගය - 2025"** ලෙස පැහැදිළිව සඳහන් කළ යුතුය. විභාගය සඳහා අයදුම්කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය හා සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සළකා බලනු නොලැබේ.

**(ඇ)** **(I)** **පළමු වරට මෙම විභාගය සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අයකරනු නොලැබේ.** පළමුවරට අයදුම් කරන අයදුම්කරුවන් ලෙස සලකන්නේ සාමාන්‍ය ලිපිකාර සේවයේ අධිපන්තියට පත් කිරීම සඳහා 1980, 1982, 1983, 1984, 1985, 1986, 1987, 1988, 1989, 1991, 1996, 1999 හෝ 2001 වර්ෂවල පවත්වන ලද සීමිත තරඟ විභාගයකට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙන් හා 1985 හා 1996 වර්ෂවල පවත්වන ලද රජයේ යතුරු ලේඛක සේවයේ අධිපන්තියේ සීමිත තරඟ විභාගයකට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙන් හා 1996 වර්ෂයේ දී පවත්වන ලද රජයේ ලඝුලේඛක සේවයේ අධිපන්තියේ සීමිත තරඟ විභාගයකට පෙනී නොසිටි අයදුම්කරුවන්ගෙන් හා 1999 වර්ෂයේ දී පවත්වන ලද රජයේ පොත් තබන්නා සේවයේ/රජයේ සරප් සේවයේ හෝ රජයේ ගබඩා භාරකාර සේවයේ අධිපන්තියේ සීමිත තරඟ විභාගයකට හා 2006, 2007, 2011, 2015, 2018 සහ 2023 වර්ෂවල දී පවත්වන ලද කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිපන්තියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගයන් යන විභාග අතුරෙන් එකදු විභාගයකට හෝ පෙනී නොසිටි අයදුම්කරුවන් පමණක් වේ.

**(II)** විභාග ගාස්තුව රු.1,200/-කි. මෙම ගාස්තුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට (2025.08.11) හෝ ඊට ප්‍රථම ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත යන නමට ලැබෙන පරිදි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ගෙවා ලබාගත් ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කිසිම හේතුවක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ. විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**(ඈ)** නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්ප්‍රතය හෝ ඒ හා සම්බන්ධ කිසියම් ලේඛනයක් තැපෑලේ දී අස්ථානගතවුවහොත් හෝ ප්‍රමාදවීම පිළිබඳ ලැබෙන පැමිණිලි සළකා බලනු නොලැබේ. අයදුම්පත් යොමුකිරීමේ දී, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වනතුරු රැඳී සිටීමේ දී ඇතිවන ප්‍රමාදයන් සඳහා අයදුම්කරු වගකිව යුතුය.

**(ඉ)** **අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ.**

## 8. විභාගයට ඇතුළත් කර ගැනීම :

(අ) අදාළ විභාග ගාස්තුව ගෙවා, නියමිත පරිදි අයදුම්පත්‍රය සම්පූර්ණ කර නියමිත දිනට ප්‍රථම යොමු කරනු ලැබූ සියලුම අයදුම්කරුවන් සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාවේ පෙනී සිටින විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවෙකුම විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය එම ශාලාවේ පෙනී සිටින පළමු විභාග දිනයේ දී විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. සෑම අපේක්ෂකයකුම විභාගය පැවැත්වීම සම්බන්ත්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(ඇ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පතෙහි පිටපත ද අතැතිව, විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම හා ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය යන විස්තර සඳහන් කර ශ්‍රී ලංකා විභාග දෙපාර්මේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර හා ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකය ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත.

*සටහන :-* අපේක්ෂයකුට විභාග ප්‍රවේශ පත්‍රය**ක්** නිකුත් කිරීම ඔහු **හෝ** ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීම**ක් ලෙස සළකනු නොලැබේ.**

## 9. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව:-

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් කුමන හෝ ලේඛනයක් පිළිගනු ලැබේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

**10.** සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :-

(අ) මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

(ආ) අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් උසස්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සළකා බලනු නොලබන අතර මෙම විභාගය හේතුකොට ගෙන ලබා දී තිබූ උසස්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

**11.** **විභාගයේ භාෂා මාධ්‍ය**

(i) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයින්ට තමන් සේවයට බැඳුණු භාෂා මාධ්‍යයෙන් හෝ වෙනත් රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසරදෙනු නොලැබේ.

**12.** **විභාග පරිපාටිය**:- ලිඛිත පරීක්ෂණය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වේ.

| අංකය | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු |
|---|---|---|---|
| 01 | කාර්යාල කළමනාකරණය | පැය 2 | 100 |
| 02 | කාර්යාල ක්‍රම | පැය 2 | 100 |
| 03 | ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති | පැය 2 | 100 |
| 04 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | පැය 2 | 100 |
| 05 | පොදු ප්‍රශ්න පත්‍රය | පැය1½ | 100 |
| | | | **500** |

**13.** **විෂය නිර්දේශය** :- පහත සඳහන් විෂයයන් පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර බැලීම අපේක්ෂා කෙරේ.

i. **කාර්යාල කළමනාකරණය** (කාලය පැය 02 යි ලකුණු 100)

සංවිධාන ව්‍යුහය, සංවිධාන පිළිබඳ මූලධර්මය, කාර්ය විශ්ලේෂණය හා කාර්ය ඇගයුම්, නායකත්වය, අධීක්ෂණය හා තීරණ ගැනීමේ හැකියාව, සංදේශනය, මහජන සම්බන්ධතාව, සම්බන්ධීකරණය හා ගැටළු නිරාකරණය.

ii. **කාර්යාල ක්‍රම** (කාලය පැය 02 යි ලකුණු 100)

කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම, කාර්යාල පටිපාටි, ලේඛන සහ ගොනු කිරීම, ආකෘති පත්‍ර පාලනය හා ආකෘති පත්‍ර සැලසුම් කිරීම, ලිපි ගනුදෙනු කිරීම, කාර්යාල උපකරණ භාවිතය පිළිබඳ පාලනය, කාර්යාලයේ සැලැස්ම හා වටපිටාව, රැකියා විස්තරය, වැඩ අධ්‍යයනය හා ක්‍රම අධ්‍යයනය, වැඩ මැනීම, කාර්යාල මෙහෙයුම් අත්පොත.

iii. **ආයතන කාර්ය හා කාර්ය පටිපාටික රීති** (කාලය පැය 02යි ලකුණු 100)

රාජ්‍ය සේවයට බඳවාගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග, රාජ්‍ය නිලධාරීන්ගේ ආයතනික කටයුතු, පෞද්ගලික ලිපිගොනුවක් පවත්වාගෙන යාම, රාජ්‍ය සේවකයන් පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම හා අවසන් කිරීම යන කාර්යයන්හි බලතල පැවරීම, සුභ සාධනය, රාජ්‍ය නිලධාරීන්ට හිමි වරප්‍රසාද, ආයතන කාර්ය පිළිබඳව රජය විසින් මෙතෙක් නිකුත් කර ඇති රෙගුලාසි හා චක්‍රලේඛ පිළිබඳව සාමානය අවබෝධය පරීක්ෂා කෙරේ

iv. **රාජ්‍ය මූල්‍ය කළමනාකරණය (කාලය පැය 02යි ලකුණු 100)**

වාර්ෂික ඇස්තමේන්තු හා ගණන්ත දීමේ නිලධාරියකුගේ වගකීම්, මුදල් පාලනය, මූලය වගකීම් පැවරීම, මුදල් භාර ගැනීම, ගිණුම් ගත කිරීම හා ප්‍රතිග්‍රහණය කිරීම, ගෙවීම්, රාජ්‍ය මුදල් භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, සැපයුම් හා සේවා, ප්‍රසම්පාදන කටයුතු, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාලවල භාවිත වන ලෙජර්, ආදායම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම් හා මූලය පාලන පොත්පත්, රාජ්‍ය මුදල් භාවිතය පිළිබඳ මෙතෙක් නිකුත් කර ඇති චක්‍රලේඛ හා රෙගුලාසි පිළිබඳ සාමානය අවබෝධය පරීක්ෂා කෙරේ.

v. **පොදු ප්‍රශ්න පත්‍රය** (කාලය පැය **1 1/2** යි ලකුණු **100**)

රාජ්‍ය පරිපාලනයේ ස්වභාවය, රාජ්‍ය පරිපාලන ව්‍යුහය, රාජ්‍ය ප්‍රතිපත්ති හා නව රාජ්‍ය ප්‍රතිසංස්කරණ, මූලික අයිතිවාසිකම්, මානව හිමිකම්, මානව හිමිකම් කොමිෂන් සභාව, ඔම්බුඩ්ස්මන්වරයා, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව, කාර්යාල සංස්කෘතිය, ආචාර ධර්ම හා සාරධර්ම, මැනවින් කාර්යාලය භෞතික පරිසරය නිර්මාණය කිරීම සහ කාර්ය මණ්ඩලයේ සුභ සාධන කටයුතු, නිල තත්ත්වය හා සිවිල් තත්ත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක පිළිගැනීම්, සේවාලාභීන්ට රාජ්‍ය නිලධාරීන්ගෙන් ඉටුවිය යුතු යුතුකම්.

14. **පත්කිරීම සඳහා තෝරා ගැනීම :**

(i). මෙම විභාගයට අදාළ සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා අවම වශයෙන් යටත් පිරිසෙයින් ලකුණු 40 බැගින්වත් ලබා ගත යුතු වේ. විභාගයේ දී ලබා ගන්නා මුළු ලකුණුවල එකතුව අනුව සැකසෙන කුසලතා අනුපිළිවෙළ අනුව අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කර බැලීම සඳහා උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් හමුවට කැඳවනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් අධිශ්‍රේණියේ පුරප්පාඩුව පවතින උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක පිහිටි කාර්යාලයක සේවය කිරීමට යටත්වන අතර අනුයුක්ත කෙරෙන කාර්යාලයේ පත්වීම් භාර ගැනීම ප්‍රතික්ෂේප කළහොත් ඔහුගේ/ඇයගේ පත්වීම අවලංගු කර ඊළඟට සුදුසුකම් ලබන අයදුම්කරුවන් පිළිවෙළින් කැඳවා පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

(ii). පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(iii). ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දැනුම් දීම අනුව විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත යොමු කරනු ලැබේ. විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් සියලුදෙනාටම අදාළ ප්‍රතිඵල ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www.results.exams.gov.lk** වෙබ අඩවියේ පළ කිරීම හෝ පෞද්ගලිකව දන්වා යැවීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදුකෙරෙනු ඇත.

15. උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද උතුරු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට සිදුකර ඇති හෝ මින් මතු සිදුකෙරෙන හෝ සංශෝධනවලට යටත්ව පත්කිරීම් සිදුකරනු ලැබේ.

16. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද, මෙම නිවේදනයේ රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

17. මෙම චක්‍රලේඛයේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුත්තේය.

**"රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද අංක 2445 දරණ 2025.07.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ නිවේදනය 16/2025 මත පදනම්ව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ."**

**ආල්වාප්පිල්ලෛ සිරි**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
**2025.07.18**